**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම - 2018**

-----------------------------------------------------------------

## 1.1 මතය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිසමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිසම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිසම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිසමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිසමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිසමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරිම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිසමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිසමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිසම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 01 දිනට රු.283,750 ක් වූ හිස්වැසුම් හා ටී ෂර්ට් තොගය ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරියේ දී මෙය නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | නිවැරදි ගිණුම්කරණ පිළිවෙත් අනුගමනය කළ යුතු බව |
| (ආ) | අනෙකුත් ගිවිසුම්ගත වියදම් යටතේ රක්ෂණ ගිවිසුම් දෙකකට අදාළව 2018/2019 කාල පරිච්ඡේද සඳහා ගෙවන ලද රු. 275,575 ක් වූ සම්පූර්ණ මුදලම 2018 වර්ෂයේ වියදම ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.173,038 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | නිවැරදි ගිණුම්කරණ පිළිවෙත් අනුගමනය කළ යුතු බව |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මු.රෙ. 137 | සේවාවන් , වැඩ හෝ සැපයුම් සම්පූර්ණ වූ විට ඒ පිළිබඳව හිමිකම් භාර ගැනීමට බලය පවරා ඇති අනුමත කිරීමේ නිළධාරියා විසින් අදාල කාර්යයන් ඉටු කිරීමට පෙර ඒ සඳහා ගෙවීම් සිදු කර තිබුණු අවස්ථා 2 ක දී රු. 39,000 ක් ගෙවා තිබුණි. | නිරීක්ෂණය පිලිගන්නා අතර ඉදිරියේදී මුදල් රෙගුලාසි අංක 137 ප්‍රකාරව කටයුතු කරනු ඇත. සම්මුඛ පරීක්ෂණ දිනට පෙර දින චෙක්පත් ලිවීම සිදු කළ ද සම්මුඛ පරීක්ෂණයට පැමිණි නිලධාරීන්ගේ එම රාජකාරි නිමවීමෙන් පසුව අත්සන් ලේඛනයේ පැමිණීම සහතික කර ගැනීමෙන් අනතුරුව ගෙවීම් සිදු කරන ලදී. | නීතිරීති රෙගුලාසි ආදියට අනුකූල ව කටයුතු කළ යුතු බව |
| (ආ) | මු.රෙ. 753(2) | 219 වැනි පොදු ආකෘති පත්‍රයේ භාණ්ඩ ලැබීම් පත්‍රිකා භාවිතා කළ යුතු වුවත් කොමිසම විසින් එම ආකෘති පත්‍ර භාවිතා කර නොතිබුණි. | නිරීක්ෂණය පිලිගනිමි. ඒ අනුව ඉදිරියේදී නිවැරදි ක්‍රියා පිලිවෙල අනුගමනය කිරීමට කටයුතු කරමි. | ආයතනයට මිලදී ගැනීම් සිදුකරන විට එම භාණ්ඩ ලැබීම්, භාණ්ඩ ලැබීම් පත්‍රිකාවල සටහන් කළ යුතුය. |
| (ඇ) | මු.රෙ. 780 | රජයේ වැඩ සහ සේවාවන් ඉටු කිරීමේදී අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාවෙන් යුතුව ඒවා ඉටු කිරීම සිදු කළ යුතු වුවත් ඊට පටහැනිව සහසක් නිමැවුම් ප්‍රදර්ශනය වෙනුවෙන් අවස්ථා 3 කදී සිදුකළ මිලදී ගැනීම් වලදී රු.566,710 ක් අරපිරිමැස්මෙන් තොරව වියදම් කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1609 හා 2017.08.23 දිනැති ලිපිය මගින් මෙම නව තනතුර ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලැබුණි. එම තනතුර සඳහා 2017.09.18 වන දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් දෙදෙනෙකු සහභාගී වූ අතර සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව බඳවා ගැනීමට පාලක මණ්ඩල පත්‍රිකා අංක 2017(6)-16-4(i) න් අනුමැතිය ලැබුණි. එසේම රු.2000 ක දීමනාවක් ගෙවීමට ද පාලක මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. | රාජ්‍ය ආයතනයක් විසින් වියදම් දැරීමේදී ආර්ථිකභාවය හා කාර්යක්ෂමතාවය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ**<br><br>ii පරිච්ඡේදයේ 5.4.3 වගන්තිය | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක අවම සාමාජිකයින් ගණන 3 ක් හා අත්‍යවශ්‍යම සාමාජිකයින් ගණන සිටීම ප්‍රමාණවත් වුවත් ඊට පටහැනිව රියදුරන් දෙදෙනෙකු බඳවා ගැනීම සඳහා හත් දෙනෙකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ආයතනයක් විසින් වියදම් දැරීමේදී ආර්ථිකභාවය හා කාර්යක්ෂමතාවය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. |
| (ඉ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහෙයේ**<br>ii පරිච්ඡේදයේ 5.4.4 වගන්තිය | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයන් ලැබුනු පසු පත්කිරීම සිදු කිරීම කොමිසමේ පත්වීම් බලධාරියා වන පාලක මණ්ඩලය මගින් සිදුකළ යුතු වුවත් රියදුරන් බඳවාගැනීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට, පාලක මණ්ඩලය ද ඇතුළත් වී තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේ දී නිවැරදි ක්‍රියා පිළිවෙල අනුගමනය කිරීමට කටයුතු කරමි. | බඳවාගැනීම ස්වාධීනව හා අපක්ෂපාතීව සිදු කිරීම සඳහා සුදුසු පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කළ යුතු බව |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,982,586 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.843,425 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,826,011 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ ප්‍රදාන රු.7,071,203 කින් වැඩිවී තිබුණද, පරිපාලන වියදම් රු.3,459,172 කින් හා නව නිපැයුම්කරුවන්ගේ දිරිදීමනා වියදම් රු.7,963,664 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකාව තුළ නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම හා ස්ථාපිත කිරීම සඳහා මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා රු. 1,680,000 ක් 2017 වර්ෂයේදී වියදම් දරා තිබුණද 2019 අප්‍රේල් විගණන දින වන විටත් එම මාධ්‍ය ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව භාවිතයට ගෙන නොතිබුණි. | විගණන විමර්ශනයක් සිදුවෙමින් පවතී. | රාජ්‍ය ආයතනයක් විසින් වියදම් දැරීමේදී ආර්ථිකභාවය හා කාර්යක්ෂමතාවය පිළිබඳ සැලකිලිමත් විය යුතු බව |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ පෙබරවාරි වන විට පුරප්පාඩුව පැවති වැඩසටහන් නිලධාරී තනතුරක් හා කළමණාකරන සහකාර තනතුරක්ද 2018 ඔක්තෝබර් 04 දින වන විට පුරප්පාඩු වූ වැඩසටහන් නිලධාරි තනතුරක් ද ලෙස තනතුරු 3ක් 2018 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ බඳවාගත යුතු බවට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණද 2019 මැයි වන විටත් එම බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | ජුනි මාසය තුල සම්මුඛ පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට කටයුතු කර ඇත. | අනුමැතිය ලැබීඇති බැවින් තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම් කඩිනමින් කළයුතු බව |
| (ආ) | පනතේ අවශ්‍යතාව අනුව නව නිපැයුම්කරුවන්ගේ අරමුදල යටතේ ණය මුදල් ලබා දීමේ දී සපුරාලනු ලබන සුදුසුකම් යටතේම නව නිපැයුම් දිරිය නමින් වූ නව මූල්‍යාධාර ලබා දීමේ ව්‍යාපෘතියක් 2016 වර්ෂයේ සිට සිදුකරනු ලබන අතර ඒ සඳහා 2016 සිට 2018 දක්වා නව නිපැයුම් දිරිය නව ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ රු.52,800,000 ක් අතරින් රු.24,031,564 ක් ගෙවීම් කර තිබුණි. නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 15 වගන්තියේ (1) හා (2) ප්‍රකාරව නව නිපැයුම් දිරිය ව්‍යාපෘතිය සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය හා අමාත්‍යාංශ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නිරීක්ෂණය පිලිගනිමි. මෙය නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | ගෙවීම් කිරීමට ප්‍රථම අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය. |
| (ඇ) | නව නිපැයුම් දිරිය යටතේ ලබාදුන් ණය මුදලෙන් නිපැයුම්කරු විසින් සිදුකළ නිෂ්පාදන කටයුතු පිළිබඳ වාර්තා එවා නොතිබුණු අවස්ථාද කොමිසම විසින් පසුවිපරම් කටයුතු සිදුකර ප්‍රගතිය පිළිබඳ වාර්තා ඉදිරිපත් කර නොතිබූ අවස්ථාද විගණනයේදී නිරීක්ෂණය විය | අරමුදලින් ලබාදෙන ආධාර හා ණය සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර එයට පාළක මණ්ඩල අනුමැතිය ද ලබා තිබේ. | ලබාදුන් ණය හා ආධාර මුදල්වල කාර්යසාධනය පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකළ යුතුබව. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 9 ක කාලයක සිට මූල්‍ය ප්‍රකාශණවල ඉදිරියට ගෙනෙමින් පවතින නිරවුල් නොවූ හා තහවුරු නොවූ රු.9,802,964 ක් වූ ණය ශේෂ සඳහා සියයට සීයක් අඩමාන ණය වෙන්කර තිබුණි. එම ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව පොත්වලින් කපාහැරීමට අමාත්‍යාංශ අනුමැතිය ඉල්ලා තිබුණි. | අදාල නව නිපැයුම්කරුවන් පිලිබඳ සොයා බලා ශේෂයන් කපා හැරීමට ගතයුතු ක්‍රියාමාර්ගයන් විධිමත් පරිදි ඉටුකිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | රජයට අයවිය යුතු මුදල් අයකරගැනීමට කටයුතු කළයුතු බව |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

### 3.4.1 සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා ටී ෂර්ට් මිලදී ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා රු.998,450 ක් වටිනා ටී ෂර්ට් 1270 ක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබූ අතර එම ආයතනය තෝරාගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර නොතිබුණි. | නිරීක්ෂණය පිළිගනිමු. දැනට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම තුළ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කරනු ලැබේ. | භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. |

### 3.4.2 නවෝත්පාදන කඩිනම් කරවීමේ අරමුදල

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන වැඩි කිරීමේ හා එම නවෝත්පාදන කඩිනමින් රටේ ආර්ථිකයට හා සමාජයට එක් කිරීමේ අරමුණින් යුතුව නවෝත්පාදකයන්ට ණය ලබාදීම සඳහා 2017වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යටතේ රු .මිලියන 100ක් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මෙම අරමුදල මෙහෙයවීම සඳහා උපදේශන සේවා ලබාගැනීමට අදාල ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් තොරව උපදේශක ආයතනයක සේවය ලබාගෙන තිබුණි. අදාළ උපදේශන ආයතනය හා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම අතර ගිවිසුම් 2017නොවැම්බර් 01දින අත්සන් කර තිබූ අතර එම අවස්ථාව වන විට අදාල ආයතනය ලියාපදිංචි ආයතනයක් නොවුණි. | උපදේශකයකුගේ සේවය ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කළ නමුත් එහිදී සම්පූර්ණ ක්‍රියාවලියේ අඩුපාඩුවක් තිබූ බව පිළිගැනීමට සිදුවන අතර එහි සිදුවී ඇති අඩුපාඩු මීලඟ ගිණුම් වර්ෂයේ වැඩසටහන්වලදී නිවැරදි ආකාරයෙන් සිදු කිරීමට අවශ්‍ය අවධානය යොමුකර ඇත. | රජයේ නීතිරීති හා විධිවිධාන වලට අනුගතව ක්‍රියාකළ යුතු බව හා නීතිරීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු නොකල නිළධාරීන් හඳුනාගෙන විනයානුකූලව කටයුතු කිරීම. |
| (ආ) | තාක්ෂණික ඇගයීම් කමිටුව හා කොමිසම මඟින් ඍජුවම සිදුකල යුතු කාර්යයන් 3 ක් ගිවිසුමේ ඇතුළත් කර තෝරාගත් උපදේශන ආයතනයට පවරා තිබුණි | එම තෝරා ගැනීමේ උපමාන සැකසීමේදී නෛතික භාවය තහවුරු කර ගැනීම සඳහා අවධානය යොමුනොවීම අඩුපාඩුවක් ලෙස හඳුනාගෙන ඇත. ඉදිරියේදී එය වලක්වා ගැනීමට කටයුතු කරනු ඇත. | ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යයන් නිවැරදිව හඳුනාගෙන ගිවිසුම් වලට එලඹිය යුතු අතර එය කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගිවිසුමෙහි අංක 8 හා 12 වගන්ති ප්‍රකාරව දත්ත පද්ධතියන් සකස් කිරීම උපදේශක ආයතනයේ කාර්යයක් වුවත් එය ඉටුකර නොතිබුණි | නිරීක්ෂණය පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාළ මුදල් ගෙවීමට පෙර ඉටුකළ කාර්යය, එහි ප්‍රමාණාත්මකබව හා නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය යුතු බව |
| (ඈ) | අරමුදල මෙහෙයවීමේ කාර්යයන් සිදුකිරීම වෙනුවෙන් මාසික ප්‍රගතිය ලබාගැනීමෙන් පසු උපදේශන ආයතනයට ගෙවීම් සිදුකල යුතු වුවත් එම වාර්තා ලැබීමට ප්‍රථම මසකට රු.385,000 බැගින් මාස 12 ක් සඳහා රු.4,620,000 ක් ගෙවීම් සිදුකර තිබුණි. | ගිවිසුම අනුව පළමු වාරිකය ගෙවීම සඳහා ප්‍රගතිය අපේක්ෂා කර නොමැති අතර එය ගිවිසුම අත්සන් තැබීමේදී සිදු කිරීමට එකඟ වී ඇත. දෙවැනි මස සිට ප්‍රගතිය ලැබීමෙන් පසු ගෙවීමට එකඟ වීඇත. එබැවින් 2017 දෙසැම්බර් මසට අදාළ මාසික ප්‍රගතිය 2018 ජනවාරි 04 වැනිදා ලැබී ඇති අතර ඒ සඳහා ජනවාරි 05 වන දින ගෙවීම සිදුකර ඇත. | අදාළ මුදල් ගෙවීමට පෙර ඉටුකළ කාර්යය, එහි ප්‍රමාණාත්මකබව හා නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය යුතු බව |
| (ඉ) | මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා අයදුම් කර තිබුණු මුළු අයදුම්පත් ගණන 24ක් වූ අතර ඉන් අයදුම්කරුවන් 4 දෙනෙකු සඳහා පමණක් එකතුව රු. 9,127,600 ක් ණය ලබා දී තිබුණි. ඒ අනුව අරමුදලෙන් නව නිපැයුම්කරුවන්ට ලබාදුන් ණය වටිනාකමින් සියයට 50 කට ආසන්න අගයක් උපදේශන ආයතනයට උපදේශන ගාස්තු ලෙස ගෙවීම් කර තිබුණි. | අලුත් වැඩසටහනක් බැවින් මූලික ප්‍රාග්ධන වියදම වැඩිවීම සහ අදාල විෂය පරාසය පිළිබඳ වැඩි අවබෝධයක් නොතිබිණි. තවද දෙවන වසරේ සිට උපදේශක ආයතනයක් නොමැතිව කොමිසම මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බැවින් එම වියදම අවම කරගෙන ඇත. මෙම වැඩසටහනේ පළමු වසරෙහි සිදුව ඇති අඩුපාඩු මග හරවා දෙවැනි වසර ක්‍රියාත්මක කිරීම සඳහා කොමිසමෙහි නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමටත් කොමිසම අපේක්ෂා කරයි. | අදාළ මුදල් ගෙවීමට පෙර ඉටුකළ කාර්යය, එහි ප්‍රමාණාත්මකබව හා නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය යුතු බව |

### 3.4.3 සහසක් නිමැවුම් ප්‍රදර්ශනය 2018

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වාර්ෂිකව සංවිධානය කරනු ලබන ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය වන "සහසක් නිමැවුම්" ප්‍රදර්ශනය 2018 වර්ෂයේ සැප්තැම්බර් 14 සිට 16 දක්වා පවත්වා තිබුණි.<br>ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා ස්ථානයක් වෙන් කරවා ගැනීමේ දී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමෙන් තොරව සැපයුම්කරුවකු තෝරාගෙන තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. 2019 වර්ෂයේ දී දල නිවැරදි ක්‍රමවේදයක් යටතේ ලියාපදිංචි තැපැල් හරහා මිල කැඳවීම් කිරීමට කටයුතු කර ඇති අතර ලංසු විවෘත කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රමවේදයන් යටතේ ඇති මාර්ගොපදේශයන් අනුගමනය කරමින් එම කටයුතු ඉටු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | රජයේ කටයුතු සඳහා සැපයුම් හා සේවා ලබාගැනීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදශ සංග්‍රහය අනුගමනය කළ යුතු බව |
| (ආ) | සහසක් නිමැවුම් 2018 ප්‍රදර්ශනයේ මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සඳහා පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබූ අතර ඒ සඳහා රු. 2,650,000 ක් ගෙවා තිබුණි. මින් රු.1,250,000 ක් ගෙවීම්කර ඇත්තේ දිනමිණ, තිනකරන්, ඩේලි නිවුස්, ලංකාදීප හා ඩේලි මිරර් යන පුවත්පත්වල දැන්වීම් පලකිරීමටය. පුවත්පත්වල පල කිරීම සඳහා දැන්වීම නිර්මාණය කිරීම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කාර්ය මණ්ඩලය මඟින් සිදුකර තිබූ හෙයින් එය පුවත්පත් හි පල කිරීම සඳහා අතරමැදියෙකු වෙත රු. 1,250,000 ක් ගෙවීම කර තිබුණි. | මෙම කාර්යය සිදු කිරීමට තෝරා ගන්නා ලද ආයතනයෙහි කාර්යභාරයක් ලෙස පුවත්පත්වල පල කිරීම තිබූ අතර එබැවින් එම කාර්යය ඔවුන් විසින් ඉටු කරන ලදී. ඉදිරියේදී ආයතනයට සෘජුවම කිරීමට හැකි සේවාවන් හා කාර්යයන් ආයතනයේ කාර්ය මණ්ඩලය යොදවා ගනිමින් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | රජයේ වියදම් දැරීමේ දී ආර්ථිකභාවය හා කාර්යක්ෂමතාවය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කාර්යයන් අතුරින් රු. 11,000,000 ක් වටිනා කාර්යයන් 07 ක් සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | තාත්ත්වික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතු අතර සැලසුම් කළ කාර්යයන් ඉටු කිරීමට ප්‍රමුඛත්වය ලබාදිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දේශීය හා ජාත්‍යන්තර පේටන්ට් අයදුම්පත් 500 ක් සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට සහය දීමට කොමිසමේ ඉලක්කය වී තිබුණද වර්ෂය තුල සහය ලබා දී තිබුණේ දේශීය පේටන්ට් 60 ක් හා ජාත්‍යන්තර පේටන්ට් 03 ක් සඳහා පමණි. | පේටන්ට් බලපත්‍ර සකස් කිරීමට සංවර්ධන අංශ ස්ථාපිත කරන ලද්දේ 2017 වර්ෂයේදීය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් මේ සඳහා තනතුරු බඳවා ගැනීම් සිදුකිරීමට අනුමැතිය ඉල්ලීම සිදුකරත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබාදුන්නේ සහකාර අධ්‍යක්ෂකවරයෙකුට හා කළමනාකරණ සහකාර තනතුර සඳහා පමණි. ඒ අනුව අදාල ඉලක්ක සපුරා ගැනීමට නොහැකිය. නමුත් මේ වන විට සිටින කාර්යය මණ්ඩලය හා ආයතනයේ කළමනාකරණ සහකාරවරු උපයෝගී කර ගනිමින් පේටන්ට් බලපත්‍ර සැකසීම කාර්යක්ෂමව සිදුකරන අතර 2019 මැයි මාසය වන විට පේටන්ට් බලපත්‍ර 33 ක් සම්පූර්ණ කර ගැනීමට හැකියා ලැබී ඇති බව දන්වා සිටිමු. තව ද පේටන්ට් සැකසීම සඳහා ආයතනයට නීති නිලධාරී තනතුරු 02 ක් ස්ථාපිත කිරීම සඳහා ඉල්ලීම් කර ඇති අතර එම තනතුරු 02 බඳවා ගැනීමෙන් පසු මෙම ක්‍රියාදාමය කාර්යක්ෂමව කරගත හැකි බව දන්වමි. | වඩාත් තාත්ත්විකව සැලැස්මක් සකස් කිරීමට ක්‍රියාකළ යුතුබව. |
| (ඇ) | බිම් මට්ටමේ නිර්මාණශීලිත්වය හා නව නිපැයුම්කරණය නඟා සිටුවීම සඳහා ක්‍රියාශීලි නව නිපැයුම් කව 50 ඇති කිරීම හා දියුණු කිරීමට ඉලක්කයන් ඇති කරගෙන තිබුණද 2018 වර්ෂය තුළ නව නිපැයුම් කව 1ක් පමණක් බිහිකර තිබුණි. | 2019 වර්ෂය මැයි මාසය වන විට නව නිපැයුම් යොවුන් සමාජ 03 ක් මේ වන විට පිහිටුවා ඇති අතර මේ සඳහා පාලක මණ්ඩල අනුමැතියක් යටතේ නව නිපැයුම් දිරිගැන්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් ලබා දීමටත් නව නිපැයුම් යොවුන් සමාජ පිහිටුවීම ප්‍රචලිත කිරීමටත් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | තාත්ත්වික සැලසුම් සකස්කළ යුතු අතර එම සැලසුම් ලඟාකර ගැනිමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු බව. |